ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ තනතුරු දරන සියළුම නිලධාරීන් වෙත

**<u>ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා දැනටමත් I ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන් අතරින් සුදුසු නිලධාරීන් පත් කිරීම</u>**

2023.10.11 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2023 හි අන්තර්කාලීන විධිවිධාන ප්‍රකාරව I ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු සඳහා, I ශ්‍රේණියට උසස්කිරීම සඳහා දැනටමත් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් අතරින් සුදුසු නිලධාරීන් පත් කර ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

02. ඒ අනුව පුරප්පාඩු තනතුරු සඳහා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ දැනටමත් I ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන් ඉල්ලුම් කරනු ලබන්නේ නම්, ඒ සඳහා වන ඉල්ලීම් 2024.02.02 දිනට ප්‍රථම ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 ලිපිනයට පහත ලේඛන සමඟ යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

i. නිලධාරියාගේ ඉල්ලීම් ලිපිය
ii. ස්ථාන මාරුවීමට අපේක්ෂා කරන ආයතනයේ ප්‍රධානියාගේ එකඟතාවය
iii. නිලධාරියා නිදහස් කිරීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය
iv. දැනට දරන I ශ්‍රේණියේ තනතුරට අදාළ විධිමත් පත්කිරීම් ලිපියේ සහතික කරන ලද පිටපත
v. EST 12 ආකෘති පත්‍රය

03. දැනටමත් I ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන් පමණක් මේ සඳහා අයදුම්කරන ලෙස දන්වන අතර 2024.02.02 දිනට පසුව ලැබෙන ඉල්ලීම් සම්බන්ධව කටයුතු කරනු නොලබන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

දිනය : 2024.01.16

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2023 ප්‍රකාරව**

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු ලේඛනය**

| අනු අංකය | ආයතනය |
|---|---|
| 1 | වාරිමාර්ග අමාත්‍යාංශය |
| 2 | තාක්ෂණ අමාත්‍යාංශය |
| 3 | වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය |
| 4 | මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය |
| 5 | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව |
| 6 | වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව |
| 7 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව |
| 8 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 9 | මුදල් කොමිෂන් සභාව |
| 10 | උතුරු සහ නැගෙනහිර සංවර්ධනය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය |
| 11 | මැතිවරණ කොමිෂන් සභාව |
| 12 | බස්නාහිර පළාත් සභාව |
| 13 | උතුරු මැද පළාත් සභාව |
| 14 | වයඹ පළාත් සභාව |
| 15 | ඌව පළාත් සභාව |